# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2178/18 - 2020 ජූනි මස 02 වැනි අඟහරුවාදා - 2020.06.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ

### ජනාධිපති විධානය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් අතිගරු ජනාධිපතිතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සුරක්ෂිත රටක්, විනය ගරුක, ගුණ ගරුක හා නීති ගරුක සමාජයක් ගොඩනැගීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකායක් ස්ථාපනය කිරීම.

1. මේජර් ජනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මැතිතුමා
   ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය
2. ලුතිතන් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා මැතිතුමා
   යුධ හමුදාපති
3. වයිස් අද්මිරාල් පියල් ද සිල්වා මැතිතුමා
   නාවික හමුදාපති
4. එයාර් මාර්ෂල් සුමංගල ඩයස් මැතිතුමා
   ගුවන් හමුදාපති
5. සී.ඩී. වික්‍රමරත්න මැතිතුමා
   වැඩ බලන පොලිස්පති
6. මේජර් ජනරාල් (විශ්‍රාමික) විජිත රවිප්‍රිය මැතිතුමා
   රේගු අධ්‍යක්ෂ ජනරාල්
7. මේජර් ජනරාල් (විශ්‍රාමික) ජගත් අල්විස් මැතිතුමා
   ජාතික බුද්ධි ප්‍රධානී
8. මේජර් ජනරාල් සුරේෂ් සලේ මැතිතුමා
   අධ්‍යක්ෂ, රාජ්‍ය බුද්ධි තොරතුරු සේවාව
9. මේජර් ජනරාල් ඒ.එස්. හේවාවිතාරණ මැතිතුමා
   අධ්‍යක්ෂ, යුධ හමුදා බුද්ධි අංශය
10. කපිතාන් එස්.ජේ. කුමාර මැතිතුමා
    අධ්‍යක්ෂ, නාවික හමුදා බුද්ධි අංශය
11. එයාර් කොමදෝරු එම්.ඩී.ජේ.වාසගේ මැතිතුමා
    අධ්‍යක්ෂ, ගුවන් හමුදා බුද්ධි අංශය
12. නියෝජ්‍ය පොලිස්පති ටී.සී.ඒ. ධනපාල මැතිතුමා
    පොලිස් විශේෂ කාර්යාංශය
13. නියෝජ්‍ය පොලිස්පති වරුණ ජයසුන්දර මැතිතුමා

1A - G 032240 — 27 (2020/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

වෙත,

ශුභාශිංසන පූර්වකවය!

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේද සඳහන් කොට ඇති පරිදි ජාතික ආරක්ෂාවට මුල්තැන ලබාදීමත්, සාධාරණය සහ නීතියේ ආධිපත්‍යයට ගරු කරන ගුණ ගරුක, විනය ගරුක හා නීති ගරුක සමාජයක් බිහි කිරීම රජයේ ප්‍රමුඛ වගකීමක් බව අවධානයට ලක් කරමින් ද,

රටක සංවර්ධනය ඉලක්ක කර ගත් ආර්ථික ක්‍රමෝපායන් ස්ථාපිත කිරීමේ දී හුදෙක්ම රටේ ආරක්ෂක තත්ත්වය ප්‍රධාන සාධකයක් බව හඳුනා ගෙන ඇති බැවින් ද,

ජනතාවගේ යහපත පිණිස ශිෂ්ඨ සම්පන්න සමාජයක් ගොඩ නැගීම උදෙසා නීතියේ රැකවරණය සැමට සමානව ලැබිය යුතු බව අවධාරණය කරමින් ද,

රටක අනාගතය වශයෙන් සලකනු ලැබූ දරු පරපුරද ඇතුළුව සමස්ථ සමාජය තුළ පැතිර යමින් පවතින මත්ද්‍රව්‍ය උවදුර ආර්ථික පරිහානිය සමග එකතු වූ සමාජ පරිහානියේ ද ප්‍රබල සාධකයක් බැවින් ඉන් සමස්ථ සමාජය මුදවා ගැනීම අත්‍යාවශ්‍ය වන බව සැලකිල්ලට ලක් කරමින්ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධුරන්ධර ගෝඨාභය රාජපක්ෂ වන මම, ඔබතුමන්ලා ගේ විචක්ෂණභාවය, සාමාර්ථය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින්, පූර්වෝක්ත ඔබතුමන්ලා, එනම්,

1. මේජර් ජනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මැතිතුමා
   ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය
2. ලුතිතන් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා මැතිතුමා
   යුධ හමුදාපති
3. වයිස් අද්මිරාල් පියල් ද සිල්වා මැතිතුමා
   නාවික හමුදාපති
4. එයාර් මාර්ෂල් සුමංගල ඩයස් මැතිතුමා
   ගුවන් හමුදාපති
5. සී.ඩී. වික්‍රමරත්න මැතිතුමා
   වැඩ බලන පොලිස්පති
6. මේජර් ජනරාල් (විශ්‍රාමික) විජිත රවිප්‍රිය මැතිතුමා
   රේගු අධ්‍යක්ෂ ජනරාල්
7. මේජර් ජනරාල් (විශ්‍රාමික) ජගත් අල්විස් මැතිතුමා
   ජාතික බුද්ධි ප්‍රධානී
8. මේජර් ජනරාල් සුරේෂ් සලේ මැතිතුමා
   අධ්‍යක්ෂ, රාජ්‍ය බුද්ධි තොරතුරු සේවාව
9. මේජර් ජනරාල් ඒ.එස්. හේවාවිතාරණ මැතිතුමා
   අධ්‍යක්ෂ, යුධ හමුදා බුද්ධි අංශය
10. කපිතාන් එස්.ජේ. කුමාර මැතිතුමා
    අධ්‍යක්ෂ, නාවික හමුදා බුද්ධි අංශය
11. එයාර් කොමදෝරු එම්.ඩී.ජේ.වාසගේ මැතිතුමා
    අධ්‍යක්ෂ, ගුවන් හමුදා බුද්ධි අංශය
12. නියෝජ්‍ය පොලිස්පති ටී.සී.ඒ. ධනපාල මැතිතුමා
    පොලිස් විශේෂ කාර්යාංශය
13. නියෝජ්‍ය පොලිස්පති වරුණ ජයසුන්දර මැතිතුමා

සුරක්ෂිත රටක්, විනය ගරුක, ගුණ ගරුක හා නීති ගරුක සමාජයක් ගොඩනැගීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකායෙහි සාමාජිකයින් ලෙස මතු දැක්වෙන කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා මෙයින් පත් කරමි.

1. වර්තමානයේ රටේ යම් යම් ස්ථානවල, නිදහස් හා සාමකාමී සමාජ පැවැත්මකට හානිකර අයුරින් මතුවෙමින් පවතින නීතිය උල්ලංඝණය කරමින් හැසිරෙන සමාජ කණ්ඩායම්වල එකී නීති විරෝධී ක්‍රියා මැඩපැවැත්වීමට අවශ්‍ය කඩිනම් පියවර ගැනීම

2. මත්ද්‍රව්‍ය උවදුරට ගොදුරුවන්නන් ඉන් වැළැක්වීම සඳහාත්, වරාය හා ගුවන් තොටුපළ ආදී ස්ථාන හරහා පිටරටවලින් මෙරටට මත්ද්‍රව්‍ය ඇතුළුවීම වැළැක්වීම සඳහාත්, රට තුළ මත්ද්‍රව්‍ය ජාවාරම පූර්ණ වශයෙන් මර්ධනය කිරීම සඳහාත්, මත්ද්‍රව්‍ය හේතුවෙන් සිදුවන අනෙකුත් සමාජ ව්‍යසනයන් වැළැක්වීම සඳහාත්, අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම
3. වෙනත් රටවල ස්ථානගත වෙමින් ශ්‍රී ලංකාව තුළ සිදු කරනු ලබන නීති විරෝධී මෙන්ම සමාජ විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් සොයා බලා එම අපරාධවලට වගකිව යුතු පුද්ගලයින්ට එරෙහිව නීති මගින් කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගැනීම
4. බන්ධනාගාර ආශ්‍රිතව සිදු කරන නීති විරෝධී හා සමාජ විරෝධී ක්‍රියා පිළිබඳව සොයා බලා ඒවා වැළැක්වීමට කටයුතු කිරීම

තවද, **ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, මේජර් ජනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මැතිතුමා කාර්යසාධක බලකායේ සභාපති** ලෙසත්,

ආරක්ෂක අමාත්‍යාංශයේ **ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, ඩී.එම්.එස්. දිසානායක මැතිතුමා උක්ත කාර්යසාධක බලකායේ ලේකම් ලෙසත්**, පත් කරමි.

තවද, මෙයින් පවරනු ලබන කර්තව්‍යයන් ඉටුකරලීමට අදාළව අවශ්‍ය විය හැකි පරිදි කරුණු සොයා බැලීමට සහ උපදෙස් නිකුත් කිරීමට සුරක්ෂිත රටක්, විනය ගරුක, ගුණ ගරුක හා නීති ගරුක සමාජයක් ගොඩනැගීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය වෙත මම මෙයින් බලය පවරමි.

තවද, සුරක්ෂිත රටක්, විනය ගරුක, ගුණ ගරුක හා නීති ගරුක සමාජයක් ගොඩනැගීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකායේ සාමාජිකයින් වන ඔබට කලින් කලට මා හට වාර්තා ඉදිරිපත් කිරීමට මෙයින් බලය පවරමි.

තවද, සුරක්ෂිත රටක්, විනය ගරුක, ගුණ ගරුක හා නීති ගරුක සමාජයක් ගොඩනැගීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් උපදෙස් නිකුත් කරනු ලැබිය හැකි නැතහොත් සේවා සැපයීම පිණිස සහාය ඉල්ලා සිටිය හැකි සියලුම රජයේ නිලධරයන් හා එබඳු සෙසු තැනැත්තන් විසින් තත් කාර්යය සම්බන්ධයෙන් නිසි අයුරින් පිළිපැදිය හැකි එබඳු උපදෙස්වලට අනුකූලව ක්‍රියාකළ යුතු යැයිද, ලබාදිය හැකි සියලුම සහාය සැලසිය යුතු යැයිද, සැපයිය හැකි සියලුම තොරතුරු ලබාදිය යුතු යැයිද මම මෙයින් සියලුම රජයේ නිලධරයන්ට සහ සෙසු තැනැත්තන්ට නියම කොට විධානය කරමි.

තවද, කිසියම් රාජ්‍ය සේවකයෙකු හෝ කිසියම් අමාත්‍යාංශයක, රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ වෙනත් එබඳු ආයතනයක නිලධාරියෙකු විසින් පෙරකී කාර්යසාධක බලකාය විසින් පවරන ලද රාජකාරි හා වගකීම් ඉටු කිරීම ප්‍රමාද කරන හෝ පැහැර හරින සියලු අවස්ථා මා හට වාර්තා කරන ලෙස පෙරකී කාර්යසාධක බලකායට මම මෙයින් නියම කොට විධාන කරමි.

වර්ෂ දෙදහස් විස්සක් වූ ජුනි මස 02 වන දින වූ මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදි.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**පී.බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.